# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2258/25 - 2021 දෙසැම්බර් මස 15 වැනි බදාදා - 2021.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු වරින් වර සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියෙහි 30 වන වගන්තිය යටතේ වූ රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු වරින්වර සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියෙහි 30 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද බස්නාහිර පළාත තුළ ත්‍රී රෝද රථ මගින් මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ මෙහි පහත සඳහන් රීති මෙයින් ප්‍රකාශයට පත් කරන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස් වී යූඑස්පී
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2021 දෙසැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**රීති**

1. මෙම රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834/27 හා 2013 ඔක්තෝබර් මස 30 වන දිනැති ගැසට් පත්‍රයේ ඇතුළත් ත්‍රී රෝද රථ හා කුලී රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වූ රීති පරිච්ජින්න කිරීම සඳහා පනවනු ලබයි.

2. මෙම රීති " ත්‍රී රෝද රථ හා කුලී රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් රීති පරිච්ජින්න කිරීම සම්බන්ධයෙන් වූ රීති " යනුවෙන් හැඳින්වේ.


1A - PG 5662– 50 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මෙම රීති ක්‍රියාත්මක වන දිනෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834/27 හා 2013 ඔක්තෝබර් මස 30 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ නිවේදනය කර ඇති ත්‍රී රෝද රථ හා කුලී රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වූ රීති මෙයින් පරිච්ජින්න කරනු ලබයි.

4. මෙම රීති යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගත හොත් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

EOG 12- 0149/1

---

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු බස්නාහිර පළාත් සභාවේ 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රී රෝද රථ සේවා ප්‍රඥප්තියෙහි 16 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු බස්නාහිර පළාත් සභාවේ 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රිරෝද රථ සේවා ප්‍රඥප්තියෙහි 7 වගන්තිය සහ එම ප්‍රඥප්තියේ 16 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද බස්නාහිර පළාත තුළ ත්‍රී රෝද රථ මගින් මගී ප්‍රවාහන සේවාවක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වූ මෙහි පහත සඳහන් රීති මෙයින් ප්‍රකාශයට පත් කරන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2021 දෙසැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**රීති**

1. බස්නාහිර පළාත තුළ ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් මගී ප්‍රවාහන සේවාවේ යොදවනු ලබන ත්‍රී රෝද රථ එම කාර්යයෙහි යෙදවීමට අදාලව ලියාපදිංචි කරලීම හා එම කාර්යයෙහි යෙදවීම සඳහා වූ අවසරපත්‍රයක් ලබා දීම ඇතුළු ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස මෙම රීති පනවනු ලබයි.

2. මෙම රීති " බස්නාහිර පළාතේ ත්‍රී රෝද රථ මගින් මගී ප්‍රවාහන සේවාවන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ රීති " යනුවෙන් හැඳින්වේ.

3. බස්නාහිර පළාත තුළ ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙන් මගී ප්‍රවාහන සේවාවේ යොදවන සෑම ත්‍රිරෝද රථයක්ම මින් මතුවට ත්‍රිරෝද රථ කාර්යාංශය යටතේ ලියාපදිංචි කර මෙම රීති යටතේ පළමු උපලේඛනයට ඇතුළත් ආකෘතියට අනුකූල වූ මගී සේවා අවසර පත්‍රයක් ලබාගත් ත්‍රිරෝද රථයක් විය යුතුය.

4. 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රී රෝද රථ සේවා ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය සඳහා මගී සේවා අවසර පත්‍රයක් වෙනුවෙන් ඉල්ලුම් කරනු ලබන සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය:

(1) ලියාපදිංචි සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක්ම මෙම රීති යටතේ පනවනු ලබන දෙවන උපලේඛනයට ඇතුළත් ආකෘතියට අනුකූල වූ අයදුම්පත්‍රයක් යටතේ ඉල්ලුම් කළ යුතුය.

(2) මගී ප්‍රවාහන සේවාවේ යොදවන ත්‍රිරෝද රථ එවැනි වූ සේවාවක යෙදවීමට අදාලව යෝග්‍යතාවය පිළිබඳව ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන දිනට පූර්වාසන්න මාස තුනක කාලසීමාවක් තුළ බස්නාහිර පළාතේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචිය ඇති ආයතනයක් වෙතින් ලබාගත් යෝග්‍යතා සහතිකයක් මගින් යෝග්‍යතාවය සනාථ කර තිබිය යුතුය.

(3) අදාල කාර්යයෙහි යොදවනු ලබන ත්‍රී රෝද රථය පූර්ණ අසීමිත රක්ෂණාවරණයකට යටත් කර තිබිය යුතුය.

(4) ත්‍රිරෝද රථය සඳහා පවත්නා වර්ෂයට අදාලව ආදායම් බලපත්‍රය ලබා තිබිය යුතුය.

(5) අදාල ත්‍රිරෝද රථය සඳහා වන ඉල්ලුම්කරු මගී ප්‍රවාහන කාර්යය සඳහා වන ත්‍රිරෝද රථ රියදුරකු වශයෙන් කාර්යාංශයෙහි ලියාපදිංචි රියදුරකු නොවන්නේ නම් තත්කාර්යය සඳහා යොදවනු ලබන රියැදුරු කාර්යාංශයෙහි ලියාපදිංචි රියැදුරු වන බවට සනාථ කිරීමට අදාල වන කරුණු ලේඛන මගින් තහවුරු කළ යුතුය.

(6) ඉල්ලුම්කරු 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වන සමාගමක් වන විට දී සමාගමක් වශයෙන් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

5. කාර්යාංශය යටතේ ලියාපදිංචිය ලබන සෑම ත්‍රිරෝද රථයක් සඳහාම ලියාපදිංචි කළ දින සිට වලංගු වන පරිදි ඉදිරි මාස 12 ක කාලසීමාවට අදාළ වන මගී සේවා අවසරපත්‍රයක් කාර්යාංශයෙහි අංශ ප්‍රධානියා විසින් නිකුත් කළ යුතුය.

6. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමට අදාලව යම් ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධව අතෘප්තියට පත්වන අයකු විසින් ඊට අදාල වන අභියාචනයක් ප්‍රතික්ෂේප කළ දින සිට දින 30ක් ඇතුළත බස්නාහිර පළාත් මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

7. ඉහත 6 වන වගන්තිය යටතේ වන අභියාචනයන්ට අදාල තීරණයන් අභියාචනයන් ඉදිරිපත් වී දින 30 ඇතුළත අභියාචනාකරුවන් වෙත දැනුම්දිය යුතු අතර, අදාල ඉල්ලීම සම්බන්ධ වූ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ තීරණය අවසානාත්මක තීරණය සේ සැලකිය යුතුය.

8. මෙම රීති යටතේ මගී සේවා අවසරපත්‍රයක් ලත් සෑම ත්‍රිරෝද රථයක්ම බස්නාහිර පළාත තුළ මගී ප්‍රවාහන සේවාවේ යෙදවීමේ දී පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව අදාල සේවාව පවත්වාගෙන යා යුතුය:

(1) මගී ප්‍රවාහනයේ දී ත්‍රිරෝද රථයකින් ගෙන යා හැකි උපරිම මගී සංඛ්‍යාව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් අනුමත මගී සංඛ්‍යාව නොඉක්මවන පරිදි හෝ කලින් කල කිසියම් වූ ලිඛිත නීතියක් යටතේ නියම කරනු ලබන මගීන් සංඛ්‍යාව නොඉක්මවිය යුතුය.

(2) මගී ප්‍රවාහන සේවාව සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් සහිත තත්කාර්යය සඳහා කාර්යාංශයෙහි ලියාපදිංචි රියැදුරකු යටතේ සේවාවන් පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

(3) සේවාවේ යොදවන සෑම අවස්ථාවකදීම අදාල ත්‍රිරෝද රථය අසීමිත රක්ෂණාවරණයකින් ආවරණය වී තිබිය යුතුය.

(4) මගී ප්‍රවාහන සේවය සඳහා යොදා ගන්නා සෑම ත්‍රිරෝද රථයකම පිටුපස දකුණු පස දොරටුව ආවරණය කර තිබිය යුතුය.

(5) මගී ප්‍රවාහනයේ යෙදෙන සෑම අවස්ථාවකදීම ප්‍රවාහන කාර්යයෙහි නියුතු රියැදුරු කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත පැළඳ සිටිය යුතුය.

(6) මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන සෑම ත්‍රිරෝද රථයක්ම එම ත්‍රිරෝද රථයේ ගමන් කරන්නන්ට පහසුවෙන් පෙනෙන පරිදි පහත සඳහන් තොරතුරු ප්‍රදර්ශනය කර තිබිය යුතුය:

(අ) ත්‍රිරෝද රථයේ අයිතිකරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය

(ආ) සේවාවේ නියුතු රියදුරුගේ නම, ලිපිනය හා දුරකථන අංකය

(ඇ) ත්‍රිරෝද රථය කාර්යාංශයෙහි ලියාපදිංචි අංකය සහ රියදුරු ලියාපදිංචි අංකය

(ඈ) රියදුරු ඡායාරූපය

(7) නියමිත ගාස්තු ප්‍රමාණයන්ට අනුකූලව මගී ප්‍රවාහනය සඳහා වන ගාස්තු නියම කිරීමට හැකි වන පරිදි ගාස්තු අයකිරීම සඳහා භාවිතයට ගන්නාට ප්‍රදර්ශනය වන ආකාරයට ගාස්තු මීටරයක් සවිකර තිබිය යුතුය.

(8) මගී ප්‍රවාහන සේවාව සඳහා එදිනට අදාල වන ගාස්තු ප්‍රමාණයන් ත්‍රිරෝද රථයේ ඉදිරි වම්පස පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතුය.

(9) ප්‍රවාහන සේවාවෙහි නියුතු සෑම අවස්ථාවකදීම මෙහි පහත සඳහන් ලේඛන රියැදුරු භාරයේ පවත්වා ගත යුතුය:

(අ) මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය

(ආ) සියළු මගීන් සඳහා පූර්ණ සහ අසීමිත රක්ෂණ සහතිකය

(ඇ) වලංගු ආදායම් බලපත්‍රය

(ඈ) රියැදුරු බලපත්‍රය හා කාර්යාංශයේ ලියාපදිංචි හැඳුනුම්පත

(10) අවසර පත්‍රයට ඇතුළත් ප්‍රදර්ශනය කළ යුතු බවට සඳහන් කොටස පැහැදිලිව පෙනෙන සේ ත්‍රී රෝද රථයෙහි ඉදිරිපස ප්‍රදර්ශනය කළ යුතුය.

(11) මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන සෑම ත්‍රීරෝද රථයක්ම මගීන්ගේ සුවපහසුව සඳහා හේතු වන ආකාරයට මෙන්ම මෝටර්රථ වාහන පනත යටතේ වන නියෝගවලට අනුකූලව ආසන ඇතුළු අනෙකුත් සියළු පහසුකම් පවත්වාගෙන යා යුතුය.

(12) මගී ප්‍රවාහන සේවාවේ යොදවන ත්‍රීරෝද රථයක් යටතේ සේවා අපේක්ෂිත මගීන්ගේ හා පොදු මහජනතාවගේ යහපැවැත්මට බාධාවන ආකාරයට හෝ සදාචාරයට පටහැනිවන ආකාරයට හෝ අනිසි චේතනා ආරෝපණය වන ආකාරයට හෝ කායිකව හෝ මානසිකව පීඩාවක් ඇති වන ආකාරයට ශබ්දයන් ජනිත කිරීම හෝ යම් චිත්‍රයක් ප්‍රදර්ශනය කිරීම හෝ යම් රූපයක් ප්‍රදර්ශනය කිරීම හෝ යම් ප්‍රකාශයක් ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතුය.

09. මගී ප්‍රවාහන සේවාවන් සඳහා ලියාපදිංචිය වෙනුවෙන් එක් තැනැත්තෙකු විසින් ත්‍රීරෝද රථ කිහිපයක් සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවකදී එසේ ඉල්ලුම් කරනු ලබන සෑම ත්‍රීරෝද රථයක් සඳහාම වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා වන සෑම ලියාපදිංචියක්ම සහ මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කිරීම වෙන් වෙන් වූ සේවාවන් වශයෙන් සලකා ක්‍රියා කළ යුතුය.

10. කිසියම් ත්‍රීරෝද රථයක් සඳහා ලබාගත් අවසර පත්‍රයක් අවසර පත්‍රයට අදාල ලියාපදිංචිය ඇති ත්‍රීරෝද රථයෙහි භාවිතය සඳහාම අදාල විය යුතු අතර, එය කවර තත්ත්වයක් යටතේ හෝ අන්‍යභාවිතයක් සඳහා යොදා ගැනීම නොකළ යුතුය.

11. නිකුත් කරනු ලබන මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයට අදාල වන කාලසීමාව තුළ අවසර පත්‍රය කාර්යාංශයේ පූර්ණ අවසරයකින් තොරව කිසිදු ආකාරයකින් අන්සතු කිරීමක් කළ නොහැකිය.

12. පහත සඳහන් අවස්ථා යටතේ කාර්යාංශයෙහි ලියාපදිංචිව ඇති ත්‍රීරෝද රථයට අදාලව ලියාපදිංචි හා ඒ යටතේ නිකුත් කරන ලද අවසරපත්‍රයක් අවලංගු වූවා සේ සැලකිය හැකිය.

(1) ලියාපදිංචි අයිතිකරු විසින් හෝ රියැදුරු විසින් 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන රීති යටතේ වන උල්ලංඝනයකට අදාලව අවස්ථා 03 ක් හෝ ඊට වැඩි වාර සංඛ්‍යාවක් වරදකරු කර තිබීම.

(2) ත්‍රීරෝද රථයෙහි ලියාපදිංචි අයිතිය වෙනස් වීම.

(3) ලියාපදිංචියට අදාල ත්‍රීරෝද රථය කිසියම් සාපරාධි ක්‍රියාවකට එහි අයිතිකරු විසින් හෝ රියදුරු විසින් යොදවාගෙන ඇති බවට අධිකරණයක් ඉදිරියේ කරුණු තහවුරු වන කවර හෝ අවස්ථාවක.

13. ඉහත 12 වන වගන්තිය යටතේ මෙම රීති යටතේ වූ ලියාපදිංචි හා ඒ යටතේ වූ අවසරපත්‍රය අවලංගු වීමට කරුණු යෙදී ඇති කවර හෝ අවස්ථාවක අදාල ත්‍රී රෝද රථයේ ලියාපදිංචිය හා ඊට අදාල අවසර පත්‍රය අවලංගු කිරීම කාර්යාංශයේ අංශ ප්‍රධානියාගේ කාර්යය වන අතර, එවැනි වූ තීරණයක් සම්බන්ධයෙන් ලියාපදිංචිය ලත් අය වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමට අංශ ප්‍රධානියා විසින් ක්‍රියා කළ යුතුය.

14. ඉහත 13 වන වගන්තිය යටතේ අංශ ප්‍රධානියා විසින් ගනු ලබන තීරණයට අදාලව අතෘප්තියට පත් වන අයෙකු අදාල දැන්වීමේ දින සිට දින 30ක් ඇතුළත අධිකාරියේ සාමාන්‍යාධිකාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එම අභියාචනය සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරිගේ තීරණය අවසානාත්මක තීරණය වේ.

15. ඉහත 13 වන වගන්තිය යටතේ ලියාපදිංචිය හා අවසර පත්‍රය අවලංගු කරනු ලබන තීරණයට අදාල වන ත්‍රීරෝද රථයේ ලියාපදිංචිකරු 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ සේවා ප්‍රඥප්තිය යටතේ හෝ ඊට අනුප්‍රාප්ත වන කවර හො ප්‍රඥප්තියක් යටතේ බස්නාහිර පළාත තුළ ත්‍රීරෝද රථයක් මගින් මගී ප්‍රවාහන සේවාවක් පවත්වා ගෙන යාම සඳහා ලියාපදිංචියක් හෝ අවසර පත්‍රයක් වෙනුවෙන් ඉල්ලුම් කිරීමට එකී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ දින සිට අනුගාමී වසර 03ක කාලසීමාවක් තුළ නුසුදුස්සෙකු විය යුතුය.

16. මගී ප්‍රවාහන කාර්යය සඳහා ලියාපදිංචි ත්‍රීරෝද රථයක් සම්බන්ධයෙන් වන අවසරපත්‍රයක් වලංගු කාලය දීර්ඝ කර ගැනීමක් සඳහා වන සෑම ඉල්ලීමක් ම අවසර පත්‍රයේ වලංගු කාලසීමාව අවසන් වීමට පූර්වාසන්න මාස 02ක කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතුය.

17. ඉහත 16 වන වගන්තිය යටතේ සඳහා වන සෑම ඉල්ලීමක්ම මෙම රීති යටතේ 04 වන වගන්තියට අදාළ විය යුතුය.

18. අවසර පත්‍රයක වලංගු කාලය දීර්ඝ කර ගැනීම සඳහා ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම ඒ සඳහා අයකරනු ලැබීමට නියමිත ගාස්තුවට අමතර අධි ගාස්තුවක් සහිතව අදාල ඉල්ලුම්පත්‍රය පිළිගෙන කටයුතු කිරීමට මෙම රීති යටතේ බාධාවක් නොවිය යුතුය.

19. ත්‍රීරෝද රථය මගින් මුදලක් හෝ ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම සඳහා යොදවනු ලබන සෑම ත්‍රිරෝදරථ රියදුරකුම කාර්යාංශයේ ලියාපංදිංචි රියැදුරෙකු විය යුතුය.

20. ඉහත 19 වන වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම කාර්යාංශය නියම කරන ලද අයදුම්පත්‍රයක් මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

21. ඉහත 19 වන වගන්තිය යටතේ වන කාර්යයන් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම තැනැත්තෙක්ම පහත සඳහන් කොන්දේසි සපුරා ඇත්තේ නම් මිස ඒ සඳහා සුදුස්සෙකු නොවිය යුතුය:

(1) මෝටර් වාහන පනත යටතේ හා ඒ යටතේ සාදන ලද නියෝග යටතේ කරනු ලබන නියමන්ට අනුකූලව අවශ්‍යතා සම්පූර්ණ කළ අයෙකු විය යුතුය.

(2) මොටර් වාහන පනත හා ඒ යටතේ සාදනු ලබන නියෝගයන්ට අදාලව ත්‍රීරෝද රථ පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් ඇති අයෙකු විය යුතුය.

(3) මනා චරිතයකින් යුක්ත බවට ඉල්ලුම් කරනු ලබන දිනට පූර්වාසන්න මාසයක කාලසීමාවක් ඇතුළත පිළිගත් අයෙකු විසින් සහතික කළ අයකු විය යුතුය.

(4) කාර්යාංශය විසින් ඉල්ලුම්පත්‍ර යටතේ නියම කරනු ලබන අවශ්‍යතා නිසි ආකාරව සම්පූර්ණ කරමින් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ අයකු විය යුතුය

(5) පදිංචිය සනාථ කිරීම පිළිබඳව ග්‍රාමසේවා නිළධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

22. ඉහත 21 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයක් කාර්යංශයෙහි අංශ ප්‍රධානියා විසින් පිළිගනු ලබන අවස්ථාවකදී මෙම රීති යටතේ තුන්වන උපලේඛනයට අනුකූලව සම්පූර්ණව කරනු ලබන සහතිකයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතුය.

23. ඉහත 21 වන වගන්තිය යටතේ ඉල්ලුම් කිරීමට අදාලව නිසි බලධාරියා විසින් කරනු ලබන ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධයෙන් වූ තීරණයන් පිළිබඳව අතෘප්තියට පත් අයෙක් විසින් සාමාන්‍යාධිකාරි වෙත ප්‍රතික්ෂේප කිරීම දැනුම් දුන් දින සිට දින 30ක කාල සීමාවක් තුළ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, ඒ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරි විසින් ගනු ලබන තීරණය අවසානාත්මක තීරණයක් වශයෙන් සැළකිය යුතුය.

24. ඉහත 22 වන වගන්තිය යටතේ කරනු ලබන ලියාපදිංචිය පහත සඳහන් අවස්ථානුගත කරුණු යටතේ කාර්යාංශයේ අංශ ප්‍රධානියා විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය:

(1) ලියාපදිංචි ලත් තැනැත්තා මෝටර් වාහන පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝගයක් උල්ලංඝනය කරමින් දිගින් දිගටම කටයුතු කරන බවට අංශ ප්‍රධානියා සෑහීමකට පත්වන කවර හෝ අවස්ථාවක

(2) ලියාපදිංචිලත් තැනැත්තා සාපරාධී වරදකට අදාලව අධිකරණයක් විසින් වරදකරු කර ඇතිවිටෙක.

(3) ලියාපදිංචියලත් තැනැත්තා කාර්යාංශය විසින් නියමකරනු ලබන නියමයන්ට හෝ 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝදරථ සේවා ප්‍රඥප්තියේ විධිවිධානයන්ට හෝ මෙම රීති යටතේ වන විධිවිධානයන්ට පටහැනි වන ආකාරයට දිගින් දිගටම කටයුතු කරන බවට අංශ ප්‍රධානියා සෑහීමකට පත්වන කවර හෝ අවස්ථාවක

25. ඉහත 24 වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කිරීමක් සම්බන්ධයෙන් වන තීරණයට අදාලව අතෘප්තියට පත්වන තැනැත්තෙක් ඊට අදාල අභියාචනයක් තීරණ දැනුම්දුන් දින සිට දින 30 ක කාල සීමාවක් තුළ සාමාන්‍යාධිකාරි වෙත ඉදිරිපත් කළ හැකි අතර, ඒ හා සම්බන්ධව සාමාන්‍යාධිකාරිවරයාගේ තීරණය අවසානාත්මක තීරණය විය යුතුය.

26. මගී ප්‍රවාහන කාර්යයෙහි යෙදෙන ත්‍රීරෝද රථයක් එසේ ධාවනයේ යෙදෙන කුමන අවස්ථාවේ දී හෝ ධාවනය සඳහා සූදානමින් නවතා ඇති අවස්ථාවකදී 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝදරථ සේවා ප්‍රඥප්තිය යටතේ හෝ මෙම රීති යටතේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර මගී ප්‍රවාහන කාර්යයෙහි යෙදෙන්නේද යන්න පිළිබඳව කාර්යංශයෙහි අංශ ප්‍රධානියා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද අධිකාරියේ ඕනෑම නිලධාරියෙකු විසින් පරික්ෂා කිරීම හෝ ඊට අදාල ලේඛනයක් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේය.

27. 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝදරථ සේවා ප්‍රඥප්තියේ කාර්යන් සඳහා අයකළ යුතු ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතුය.

| | | |
|---|---|---|
| i. | ත්‍රීරෝද රථයක් ලියාපදිංචි ගාස්තුව | රු. 500.00 |
| ii. | වාර්ෂික මගීප්‍රවාහන සේවා අවසර පත්‍ර ගාස්තුව | රු. 1,000.00 |

| | | |
|---|---|---|
| iii. | මගී සේවා අවසර පත්‍රය වලංගු කාලය අවසන් වන දිනට හෝ එදිනට පෙර දීර්ඝ කර නොගතහොත් අය කළ යුතු අධි ගාස්තුව සෑම මසක් හෝ ඊට අඩු කාලයක් සඳහා | රු. 100.00 |
| iv. | රියදුරු ලියාපදිංචි ගාස්තුව | රු. 1,500.00 |
| v. | මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක අනුපිටපත් ගාස්තුව | රු. 500.00 |
| vi. | රියදුරු ලියාපදිංචි සහතික අනුපිටපත් ගාස්තුව | රු. 500.00 |

28. මෙම රීති යටතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස රීතින් හි ''අධිකාරිය" යන්නෙන් 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය කර ඇති බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ද,

"සාමාන්‍යාධිකාරී යන්නෙන් බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයාද, අදහස්වේ.

29. මෙම රීති යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගත හොත් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

3 වන ඡේදය

***පළමු උපලේඛනය***

**මගීන් ප්‍රවාහනය කිරීම පිණිස නිත්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා ත්‍රීරෝද රථ ධාවන අවසර පත්‍රය**

| | | |
|---|---|---|
| අවසර පත්‍ර අංකය | | :........................................................................................................ |
| ත්‍රී රෝද රථයේ ලියාපදිංචි අංකය | | :........................................................................................................ |
| අයිතිකරුගේ / අයිති ආයතනයේ නම | | :....................................................................................................... |
| ලිපිනය | | :........................................................................................................ |
| | | ........................................................................................................ |
| ජා.හැ.අංකය | | :........................................................................................................ |
| අනුයුක්ත ප්‍රාදේශීය කාර්යාලය | | :....................................................................................................... |
| සේවා සපයන නැවතුම්පොළ | | :....................................................................................................... |
| පළාත් පාලන බලප්‍රදේශය | | :........................................................................................................ |
| පොලිස් බලප්‍රදේශය | | :....................................................................................................... |
| අවසර පත්‍රය වලංගු කාලය | සිට | :........................................................................................................ |
| | දක්වා | :........................................................................................................ |

මෙම අවසර පත්‍රය 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ සේවා ප්‍රඥප්තියේ නියමයන් හා කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබේ.

ලදුපත් අංකය 01........................................... 02...........................................

ලේබල් අංකය ............................................


මෙම අවසර පත්‍රයේ වලංගු කාල සීමාව ඉකුත් වූ පසු නැවත වලංගු කරවා නොගන්නේ නම් හෝ එම දිනට පෙර බස්නාහිර පළාතේ ත්‍රී රෝද රථ සේවා කාර්යාංශයට අවශ්‍ය වුවහොත් හෝ වහාම මෙම අවසර පත්‍රය ත්‍රී රෝද රථ සේවා කාර්යාංශය වෙත භාර දිය යුතුය.

නිකුත් කළ දිනය ..........................................

. ...........................................

කාර්යාංශ ප්‍රධානි,
ත්‍රී රෝද රථ සේවා කාර්යාංශය,
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
බස්නාහිර පළාත.

(මෙම කොටස පැහැදිලිව පෙනෙනසේ ත්‍රී රෝද රථයේ ඉදිරිපස ප්‍රදර්ශනය කළ යුතුය.)



4(1) ඡේදය

**දෙවන උපලේඛනය**

අනු අංකය : .......................

**බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.**

**බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයේ යොදවන ත්‍රීරෝද රථ ලියාපදිංචිය සහ මගී සේවා අවසර පත්‍රය ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය**

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| ලි.ප. අංකය:- |
| දිනය:- |

1. ත්‍රීරෝද රථයේ අයිතිකරු පිළිබඳ තොරතුරු :- .........................................................
   - 1.1 සම්පූර්ණ නම :- .........................................................
   - 1.2 ස්ථිර ලිපිනය :- .........................................................
   - 1.3 ත්‍රීරෝද රථයේ අංකය :- .........................................................
   - 1.4 රියදුරු බලපත්‍ර අංකය :- .........................................................
   - 1.5 නිකුත් කළ දිනය :- .........................................................
   - 1.6 ජාතික හැඳුනුම්පත් අංකය :- .........................................................
   - 1.7 දුරකථන අංකය :- .........................................................
2. මගී ප්‍රවාහන සේවයේ යෙදෙන ප්‍රදේශය පිළිබඳ තොරතුරු
   - 2.1 පොලිස් බලප්‍රදේශය :- .........................................................
   - 2.2 පළාත් පාලන බල ප්‍රදේශය :- .........................................................
   - 2.3 සේවාව සපයන නැවතුම්පල :- .........................................................
   - 2.4 දිස්ත්‍රික්කය :- .........................................................
3. ත්‍රීරෝද රථයේ රියදුරු පිළිබඳ තොරතුරු (හිමිකරු හැර වෙනත් අයෙකු ධාවනයේ යෙදේ නම් මෙම කොටස පුරවන්න)
   - 3.1 සම්පූර්ණ නම :- .........................................................
   - 3.2 ස්ථිර ලිපිනය :- .........................................................
   - 3.3 රියදුරු බලපත්‍ර අංකය :- .........................................................
   - 3.4 නිකුත් කළ දිනය :- .........................................................
   - 3.5 ජාතික හැඳුනුම්පත් අංකය :- .........................................................
   - 3.6 දුරකථන අංකය :- .........................................................

මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මගී සේවා අවසර පත්‍රයේ නියමයන් හා කොන්දේසිවලට එකඟ වන අතර මා හට මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් නිකුත් කරන මෙන් ඉල්ලා සිටිමි.

................................. .......................................,

දිනය අයිතිකරුගේ අත්සන.

4. සෑම ඉල්ලුම්පත්‍රයක් සමඟ ම පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය:-
   1. ත්‍රීරෝද රථයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත හා ඡායා පිටපතක්.
   2. ත්‍රීරෝද රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පතේ මුල් පිටපත හා ඡායා පිටපතක්.
   3. වලංගු රක්ෂණ සහතිකයේ මුල් පිටපත හා ඡායා පිටපතක්.
   4. ත්‍රීරෝද රථයේ යෝග්‍යතා සහතිකය.
   5. වලංගු ආදායම් බලපත්‍රයේ මුල් පිටපත හා ඡායා පිටපතක්.
   6. රියදුරුගේ වලංගු රියදුරු බලපත්‍රයේ මුල් පිටපත හා ඡායා පිටපතක්.
   7. රියදුරු වෛද්‍ය සහතිකයේ මුල් පිටපත හා ඡායා පිටපතක්.
   8. හිමිකරු පදිංචිය සහතික කිරීම සඳහා වන ග්‍රාම සේවා සහතිකයේ මුල් පිටපත.

**සැ.යු.** ග්‍රාම සේවා සහතිකයේ මුල් පිටපත හැර අනෙකුත් ලියවිලිවල මුල් පිටපත් පරීක්ෂාකර බලා ආපසු බාරදෙනු ලැබේ.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.**

ඉහත විස්තරය හා ලේඛන මා විසින් පරීක්ෂා කරන ලදී.......................................... දින සිට ...........................
දින දක්වා මගී ප්‍රවාහන අවසර පත්‍රයක් සඳහා රු...................................... ක මුදලක් අයකර රිසිට් පතක් නිකුත් කරන්න.

සකස් කළේ .............................. ..........................................

විෂය භාර ලිපිකරු. කාර්යාංශ ප්‍රධානි/ප්‍රාදේශීය කළමණාකරු.

.දිනය ...............................

රු.................................................ක මුදලක් අයකර අංක............................. දරන රිසිට් පත නිකුත් කරන ලදී.

.............................. ................................................

දිනය මුදල් භාරකරු / අයකැමි.

අංක..........................................දරන ත්‍රීරෝද රථයේ ලියාපදිංචි අංක ................................යටතේ ලියාපදිංචි කර ......................................දින සිට .......................................... දින දක්වා අංක ....................... දරන අවසර පත්‍රය නිකුත් කරන ලදී.

................................ ............................................

දිනය කාර්යාංශ ප්‍රධානි/ප්‍රාදේශීය කළමණාකරු.

22 වන ඡේදය

## තෙවන උපලේඛනය

**ත්‍රී රෝද රථ සේවා කාර්යාංශය - බස්නාහිර පළාත**
**රියදුරු ලියාපදිංචි සහතිකය**

රියදුරුගේ නම ..........................................................................................

රියදුරුගේ ලිපිනය ..........................................................................................

ත්‍රී රෝද රථයේ අංකය ..........................................................................................

රියදුරු ලියාපදිංචි අංකය ..........................................................................................

ජා.හැ.අංකය ..........................................................................................

රියදුරු බලපත්‍ර අංකය ..........................................................................................

පොලිස් බලප්‍රදේශය ..........................................................................................

නිකුත් කළ දිනය ..........................................................................................

**අවසර පත්‍රය නිකුත් කළ දින සිට වසරක කාලයක් සඳහා වලංගුවේ.**

..............................................................................

කාර්යාංශ ප්‍රධානී - ත්‍රී රෝද රථ කාර්යාංශය

බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවහන අධිකාරිය

අංක 89, "රන්මගපාය"

කඩුවෙල පාර, බත්තරමුල්ල

දුරකථන අංකය :

ෆැක්ස් අංකය :

EOG 12-0149/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.